කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
கொழும்புப் பல்கலைக்கழகம், இலங்கை
**UNIVERSITY OF COLOMBO, SRI LANKA**

අපේ අංකය / Our Ref. No. : මගේ අංකය - කො/ආ/11
ඔබේ අංකය / Your Ref. No. :

2021.04.28

මණ්ඩපාධිපති/ශ්‍රීපාලි මණ්ඩපය,
සියළුම පීඨාධිපතිවරුන්
සියළුම ආයතන අධ්‍යක්ෂවරුන්
ලේඛකාධිකාරී
පුස්තකාලයාධිකාරී
මූල්‍යාධිකාරී
අධ්‍යයනාංශ ප්‍රධානීන්
අංශ ප්‍රධානින් සහ නිලධාරින්
සියළුම මාණ්ඩලික නිලධාරීන්
අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවක හවතුන්

<u>විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සේවය සඳහා වාර්තා කිරීම</u>

රටේ පවතින වත්මන් වසංගත තත්වය සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය විසින් නිකුත් කර ඇති සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් සහ 2021.04.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(1) හි විධිවිධාන සැලකිල්ලට ගනිමින් කොළඹ විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය හා ආරක්ෂාව තහවුරු වන අන්දමින් විශ්වවිද්‍යාලයේ කටයුතු නියමිත පරිදි සහ බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා පහත මාර්ගෝපදේශයන් හඳුන්වා දීමට තීරණය කොට ඇත.

1. ඒ අනුව කාර්යාලය තුළදී සමාජ දුරස්ථභාවය රැක ගැනීම සහ සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කිරීම පහසු වන ආකාරයට අංශ ප්‍රධාන විසින් පිළියෙල කරන ලද සේවා මුර සඳහන් ලේඛණයකට (Roster) අනුව කාර්ය මණ්ඩලය අවම වශයෙන් සතියකට දින 03 ක් කාර්යාලීය සේවය සඳහා වාර්තා කළ යුතුය. අධ්‍යයනාංශයේ/ශාඛාවේ/අංශයේ සේවා අවශ්‍යතාවය මත සතියේ ඉතිරි දින 02 දී සේවකයන් වෙත පවරන ලද රාජකාරි මාර්ගගත ක්‍රමයට අදාල සේවකයන් විසින් ඉටු කළ යුතුය. එක් එක් සේවකයා විසින් ඉටු කරනු ලැබූ එම සියළු රාජකාරී කටයුතු Google ලේඛනයක් (form/calendar/sheet) මගින් යාවත්කාලීන කළ යුතුය. මෙහිදී කිසිදු රාජකාරී කටයුත්තක ප්‍රමාදයක් හෝ අපහසුතාවයක් ඇති නොවන ආකාරයට කටයුතු කිරීම එක් එක් සේවකයාගේ වගකීමක් වනු ඇත.

2. සේවා මුර සඳහන් ලේඛණය (Roster) සකස් කළ පසු නිලධරයෙකු සේවා මුර ක්‍රමය අනුව සේවයට වාර්තා කළ යුතු දිනයක සේවයට වාර්තා නොකළේ නම් පමණක් එම දිනය ඔහුගේ පෞද්ගලික නිවාඩුවලින් අඩු කිරීමට කටයුතු කළ යුතුය.

3. සේවයේ අවශ්‍යතාවය මත යම් සේවකයෙකුගේ කාර්යාලීය සේවය දින 03කට වඩා අවශ්‍ය වන්නේ නම් අංශ ප්‍රධාන ගේ අභිමතය පරිදි අදාල සේවකයින් සේවය සඳහා කැඳවිය හැකිය.

තැපැල් පෙට්ටි අංකය 1490, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 3, ශ්‍රී ලංකාව P.O. Box No. 1490, Cumaratunga Munidasa Mawatha, Colombo 3, Sri Lanka
தபாற்பெட்டி இல.1490, குமாரதுங்க முனிதாச மாவத்த, கொழும்பு 3. இலங்கை.

දුරකථන අංක: / தொலைபேசி இல: / Telephone Nos :

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| Vice-Chancellor | : | 2583810 | Fax : | 2586059 | E-mail | : | vc@cmb.ac.lk |
| Registrar | : | 2583818 | Fax : | 2553188 | E-mail | : | registrar@cmb.ac.lk |
| Bursar | : | 2586652 | Fax : | 2586652 | E-mail | : | bursar@cmb.ac.lk |
| General | : | 2581835, 2584695, 2585509 | | | | | |

4. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර චක්‍රලේඛයන්ට අනුව අතිකාල දීමනා ගෙවීමේදී සාමාන්‍ය රීති හා රෙගුලාසි අදාල වේ.

5. සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් කටයුතු කරන ලෙස සියළුම සේවකයින්ට දැඩිව අවධාරණය කරනු ලැබේ.

වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම්,

- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන - 0711881977 – dilani@nonaca.cmb.ac.lk
- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / අධ්‍යයන ආයතන - 0714458668 – sar@ace.cmb.ac.lk
- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / සාමාන්‍ය පාලන - 0718153257 – prasannasar@ga.cmb.ac.lk
- සහකාර ලේඛකාධිකාරී / ශිෂ්‍ය හා සේවක කටයුතු - 0714437257 – ar@ssa.cmb.ac.lk

මගින් ලබා ගත හැකිය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්යය චන්ද්‍රිකා එන්. විජයරත්න
උපකුලපති.